## පළමුවන දේව ප්‍රකාශනය

යෙසායා 52:7-10

යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**අපේ දෙවිඳාණන්ගේ ගැළවීම ලොවේ සීමාන්තයෝ දකිති.**

සුබ ආරංචි ගෙන එන, සාමය ප්‍රකාශ කරන. යහපත ගැන සුබසුන් පළ කරන ගැළවීම ගැන ලොවට දන්වන, "නුඹේ දෙවිතුමාණෝ රජකම් කරන සේක" යි සියොනට කියන, කඳු මුදුන්හි පෙනෙන දූතයාගේ පාද කොපමණ අලංකාර වන්නේ ද? නගරය මුර කරන්නන් හඬ නගා එක්ව ගී කියනු ඇත. සියොනට සමිඳාණන් වඩින බව ඔවුන් සියැසින් දකිනු ඇත. ජෙරුසලමේ නටබුන්, එක්ව ගී ගයන්න. ඝෝෂා කරමින් හඬ නගන්න. සමිඳාණෝ සිය සෙනග සැනසූ සේක. සමිඳාණෝ ජාතීන් ඉදිරියේ සියොනට ශුද්ධ බලය පෑ සේක. අපේ දෙවිඳුන්ගේ ගැළවීම ලොවේ සීමාන්තයෝ දකිති.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 98:1, 6

ඔබගේ පිළිතුර: මිහි පිට සියළු දෙන අප දෙවිඳුන්ගේ ජයග්‍රහණය දුටුවෝ ය.

ගීය: සමිඳුන්ට නව ගියක් ගයන්න. මන්ද, එතුමාණෝ අසිරිමත් ක්‍රියා කළ සේක. සිය බලයෙන් හා ශුද්ධ ශක්තියෙන් ජයග්‍රහණය ලත් සේක. සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය ප්‍රකාශ කළ සේක. විජාතීන්ගේ ඇස් හමුවෙහි සිය විමුක්ති බලය එළිදරව් කළ සේක.

එතුමාණෝ ඉශ්රායෙල් වංශය කෙරෙහි එතුමන්ගේ ප්‍රේමයත් විශ්වාසවන්තකමත් සිහි කල සේක. මිහි පිට සියලු දෙන අප දෙවිඳුන්ගේ ජයග්‍රහණය දුටුවෝ ය. එම්බා ලෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ප්‍රීතියෙන් ගී ගයන්න. ප්‍රීති ගී ගයමින් එතුමන් පසසන්න.

වීණාව වයමින් සමිඳුන්ට ගී ගයන්න. වීණාවෙන් ද ගී නාදයෙන් ද ප්‍රශංසා කරන්න. හොරණෑ හා නලා හඬින් ද රජාණන් වන සමිඳුන් අබිමුව ප්‍රීතියෙන් ගී ගයන්න. ප්‍රීති ගී ගයමින් එතුමාණන් පසසන්න.

## දෙවන දේව ප්‍රකාශනය

හෙබ්‍රෙව් 1:1-6

හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.

**දෙව් සමිඳාණෝ ස්වකීය පුත්‍රයාණන් මඟින් අප කතා කළ සේක.**

දෙවියන් වහන්සේ ආදී යුගවල දී නොයක් විට ද, විවිධාකාරයෙන් ද දිවැසිවරයන් මඟින් අප පියවරුනට කතා කළ සේක. එහෙත් දැන් මේ අවසාන කාලයේ දී උන්වහන්සේ සිය පුත්‍රයාණන් මඟින් අප කතා කළ සේක. උන්වහන්සේ කරණකොටගෙන දෙවියන් වහන්සේ මුළු විශ්වය මවා, සියල්ලේ උරුමක්කාරයාණන් කොට උන් වහන්සේ පත් කළ සේක. උන්වහන්සේගේ මහිමතාවයේ ප්‍රභාවය ද දේවත්වයේ ස්වරූපය ද වන සේක් තමන්ගේ ප්‍රබල වචනයෙන් සියල්ල දරන සේක. පාප ශෝධනය ඉටු කළ පසු, උන් වහන්සේ උත්තම ස්ථානයෙහි මහෝත්තමයාණන්ගේ දකුණත අසුන් ගත් සේක. මෙසේ දේව දූතයන්ට වඩා ශ්‍රේෂ්ඨ නාමයක් පුත්‍රයානන් වහන්සේට උරුම වූ බැවින් උන්වහන්සේ ඔවුන්ට වඩා බොහෝ සේ උතුම් වන සේක. මන්ද, "ඔබ මාගේ පුත්‍රයා ය. මම අද ඔබ ජනිත කළෙමි" යි කියාත්, "මම ඔහුට පියෙක් වන්නෙමි, ඔහු මට පුත්‍රයෙක් වන්නේ ය." කියාත් උන්වහන්සේ දේව දූතයන්ගෙන් කවරෙකුට කවදාවත් නොවදාළ සේක. උන් වහන්සේ

තමන්ගේ කුළුඳුල් පුත්‍රයාණන් ලොකයට නැවත එවන කල, "දෙවියන් වහන්සේගේ සියුල දූතයෝ උන් වහන්සේට නමස්කාර කරත්වා" යි වදාරණ සේක.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ලූක් 2:14

ආලේලූයා! ආලේලූයා!
පූජනීය දිනයක් අප මත උදා විය. ජාතීන් සියල්ලෙනි, අවුත් සමිඳුන් නමදින්න.
මන්ද, අද දින මිහිතලය මත මහා ආලෝකයක් බැබළෙන්නේ ය.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ජොහන් 1:1-18

ජොහන් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**ධර්මයාණෝ මිනිසත් බව රැගෙන අප අතර වැඩ විසූ සේක.**

ආරම්භයේදී, ධර්මයාණෝ සිටි සේක. ධර්මයාණෝ දෙවියන් වහන්සේ සමඟ සිටි සේක. ධර්මයාණෝ දෙවියන් වහන්සේව ම සිටි සේක. ආරම්භයේදී උන් වහන්සේ, දෙවියන් වහන්සේ සමඟ සිටි සේක. සියල්ල උන් වහන්සේ කරණකොටගෙන මවන ලදී. උන්වහන්සේ නොමැතිව මවන ලද කිසිවක් නොවීය. උන් වහන්සේ තුළ ජීවය විය. ඒ ජීවය මනුෂ්‍යයන්ගේ ආලෝකය විය. ආලෝකය අන්ධකාරයෙහි බබළයි. අන්ධකාරය කිසි කළෙක එය ග්‍රහණය නොකෙළේය. (දෙවියන් වහන්සේ එවා වදාළ මනුෂ්‍යයෙක් විය. ඔහුගේ නම ජොහන් ය. ඔහු පැමිණියේ, තමා මගින් සියළු දෙනා අදහාගන්න පිණිස ආලෝකය ගැන සාක්ෂි දරීමට, සාක්ෂිකරුවෙකු වශයෙනි. ඔහු ඒ ආලෝකය නොව, ඒ ආලෝකය ගැන සාක්ෂි දරන පිණිස ආ තැනැත්තේ ය.) සියලු මනුෂ්‍යයන් ආලෝකවත් කරවන සත්‍ය ආලෝකයාණෝ, ලොවට උදා වෙමින් සිටි සේක. උන්වහන්සේ ලෝකයෙහි සිටි සේක. ලෝකය ඇති වූයේද උන්වහන්සේ කරණකොටගෙන ය. එහෙත්, ලෝකයා උන්වහන්සේ හඳුනා නොගත්හ. උන්වහන්සේ සිය දේශයට වැඩම කළ සේක. එහෙත්, ස්වකීය ජනතාව උන්වහන්සේ නොපිළිගත්හ. එසේ වුව ද උන්වහන්සේ පිළිගත් සියල්ලන්ට එනම්, උන්වහන්සේගේ නාමය අදහාගත් අයට, දෙවියන් වහන්සේගේ දරුවන් ලෙස උපත ලැබීමේ වරම උන්වහන්සේ දෙවා වදාළ සේක. එසේ උපත ලැබුයේ, මානව සන්තතියෙන් වත්, කායික සබඳතාවෙන් වත්, මිනිස් පියෙකුගෙන් වත් නොව, දෙවියන් වහන්සේගෙන් ම ය. ධර්මයාණෝ මාංසගත ව අප සමඟ වැඩ විසූ සේක. දේව වරප්‍රසාදයෙන් ද සත්‍යයෙන් ද පූර්ණ උන්වහන්සේගේ තේජශ්‍රීය, එනම්, පියාණන් වහන්සේ කෙරෙන් වූ එකම පුත්‍රයාණන්ගේ තේජශ්‍රීය, අපි දුටිමු. (ජොහන් උන් වහන්සේ ගැන සාක්ෂි දෙමින්, "මට පසුව එන තැනැත්තේ මට පෙර වූ බැවින්, මට වඩා උතුම් ය යි මා කීවේ මුන් වහන්සේ ගැන ය" යි මොර ගසා කීය. උන් වහන්සේගේ පූර්ණතාවෙන් අපි සියල්ලෝම වරප්‍රසාද පිට වරප්‍රසාද ලැබීමු. කුමක්හෙයින්ද, ව්‍යවස්ථාව මෝසෙස් මගින් දෙන ලද්දේය; එහෙත් දේව වරප්‍රසාදය හා සත්‍යය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මගින් පැමිණියේය. කිසිවෙකු කවදාවත් දෙවියන් වහන්සේ දුටුවේ නැත. පියාණන්ගේ ළයෙහි වැඩවසන, උන්වහන්සේගේ එකම පුත්‍රයාණෝම උන්වහන්සේ ප්‍රකාශ කර වදාළ සේක.)

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.